උත්සාහයෙන් වීර්යයෙන්... ජීවිතය ජයගන්නට වෙර දරනා...

පින්වන්ත දූ පුතුන් උදෙසා...



# රූපයත්, ධනයත්, පිළිගැනීමත්

## ලබන්නට ක්‍රමයක් !

- සාමාවතිය හා මාගන්දියාගේ කථා වස්තුව
- නිග්‍රෝධමිග ජාතකය
- සෙනෙහෙබර ආමන්ත්‍රණය
- නිර්මාණ ඉසව්ව


ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

SCO
SHRADDHA CHARITY ORGANIZATION

www.sco.lk



මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
**අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ.**

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා**
**සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන**
**අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණ මිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දායාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා !

**නමෝ බුද්ධාය!**

ව්‍යවහාර වර්ෂ 2024 ක් වූ මැයි 01 දින දී ය.

දයාබර දුවේ පුතේ,

සත්වයන් උපදින ආකාර කිහිපයක් තිබෙන බව ඔබ දන්නවා නේද? ඔබ, අප වැනි මව්කුසින් බිහි වන සත්ව කොට්ඨාස හිඳිනවා. දෙවියන් බඹුන් නිරි සතුන් වැනි ඕපපාතික ව පහළ වන සත්ව කොට්ඨාසත්, ඇතැම් පණුවන් වැනි තෙත් පරිසරයේ උපදිනා සත්ව කොට්ඨාසත්, කුරුල්ලන් වැනි බිත්තරවලින් උපදිනා සත්ව කොට්ඨාසත් සිටින බව සම්බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා. ඒ අවබෝධය ඔබත් සැදැහැ සිතින් දරා ගන්න.

දුවේ පුතේ, මේ උපත් අතරේ අප අවසානයට සඳහන් කළ 'බිත්තරයකින් සිදු වන උපත' හෙවත් 'අණ්ඩජ උපත' පාදක කරගත්ත ලස්සන කාරණාවක් පසුගිය දිනක කියවන්නට ලැබුණා. ඒ කාරණාව තමයි, 'බිත්තරයක් ඇතුළතින් බිඳුනහොත් අලුත් ජීවිතයකි, එය ම පිටතින් බිඳුනහොත් මරණයකි' කියන දේ...

බිත්තරයක් ඇතුළතින් බිඳී යනවා කියන්නේ ඒ බිත්තරය ඇතුළේ උපත ලැබූ සත්වයා මෝරා ගිහින් නියෙන් හරි, හොටෙන් හරි බිත්තරය පළාගෙන එළියට එනවා කියන එකයි. එතෙක් බිත්තරය ඇතුළත හිටියා වෙනුවට ඒ සත්වයන් අලුත් ම පරිසරයක අලුත් ම ජීවිතයක් ලබනවා. හැබැයි, බාහිර බලයක් යොදලා බිත්තරයක් බිඳ දැමුවහොත් ඒ ඇතුළත පිළිසිඳගෙන සිටින ජීවිතය විනාශ වීම තමයි සිද්ධ වෙන්නේ...

මට ඔබට කියන්නට වුවමනා වුණේ, අපට අලුත් විදිහකට අලුතින් පටන් ගන්නට වුවමනා නම් අප එය පටන් ගත යුත්තේ අභ්‍යන්තරයෙන් කියන කාරණය යි. ඒ වෙනස, ඒ මෝරා යාම, ඒ පටන් ගැන්ම අප තුළ, අප විසින් සකස් කළ යුත්තක්...

ලෝකයේ බහුල ව දකින්නට ලැබෙන ස්වභාවය තමයි අන් අයට, අන් දෙයට ඇඟිලි දිගු කරමින් ඒ අය නිසා, ඒ දේවල් නිසා තමන්ට අපහසුවක්, පීඩාවක්, හිරිහැරයක් සිදු වුණා කියා දොස් තැබීම. එහෙත්, අපට කැමති කැමති අයුරින් පවත්වා ගන්නට නොහැකි ඒ බාහිර සමාජයෙන් අපේ රුචි අරුචිකම් අනුව කටයුතු සිදු වනවා කියන කරුණ බලාපොරොත්තු වීම සුදුසු නැහැ. බාහිර යහපත් වුණත්, නැතත් අප දක්ෂ විය යුත්තේ අභ්‍යන්තරය යහපත් කරගැනීමට නේද... එවිටයි අපට මේ ජීවිතයට අර්ථයක් උපදවන්නට හැක්කේ.

අපි සරණ ගියපු සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මනා කොට දේශනා කරන ලද උතුම් ශ්‍රී සද්ධර්මය ඕපනයික ගුණයෙන් යුක්තයි. දුවේ පුතේ, ඒ ධර්මය තමා තුළට ගළපාගෙන තමා තුළින් දැකිය යුත්තක්. ගුණධර්ම දියුණු කරමින් පුරුදු පුහුණු කරන්න තියෙන ඒ දහම් මාවතේ සැම නැගී සිටීමක් ම සිද්ධවෙන්නේ පුරුදු පුහුණු කරන කෙනාගේ ජීවිතය ඇතුළේ. ඒ විදිහට අභ්‍යන්තරික ව ගුණධර්ම පිරිපුන් කරගනිමින් අලුතින් ම ඉපදුණ සොඳුරු මිනිසුන් සතර අපායෙන් මිදුණා, සුගතිය රැක ගත්තා, දිව්‍යබ්‍රහ්ම තලවල ඉපදුණා, සසර දුක් නිමා කරලා අමා මහ නිවනටත් පත් වුණා.

දුවේ පුතේ, ඇතුළතින් අලුතින් ම උපදින්න. මොහොතින් මොහොත ගුණයන්ගෙන් වැඩෙන්න. එතකොට

ඔබේ ජීවිත බොහොම සොඳුරුයි. එයින් ඔබත් සුවපත් වෙනවා, අන් අයවත් සුවපත් කරවනවා. ධර්මය කියන්නේ සත්පුරුෂ ගුණධර්මයන්ගේ වැඩී යාමට බව ඔබත් නිතර සිහි කරන්න.

තෙරුවන් සරණ ගිය ශ්‍රාවක දරුවන් විදිහට ඔබටත් ගුණදහමින් වැඩී යමින් ජීවිතය හැමවිට ම අලුත් කරගන්නට වාසනාව උදා වේවා!

**තෙරුවන් සරණයි!**

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,

පූජ්‍ය අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ

ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

# පටුන


01. කුම්භඝෝෂක සිටුතුමාගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 17

03. නිග්‍රෝධමිග ජාතකය 23

04. රූපයත්, ධනයත්, පිළිගැනීමත් ලබන්නට ක්‍රමයක් ! 37

05. නිර්මාණ ඉසව්ව 45

අමා දම්රස වැහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

## (අප්පමාද වර්ගය)

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද
ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



# කුම්භඝෝෂක සිටුතුමාගේ කථා වස්තුව

## " දියුණුවේ රහස "

පින්වතුනේ, පින්වත් දරුවනේ, සමහර කාලවලදී සිදුවෙන විපත්ති නිසා මනුෂ්‍යයින් හට බොහෝ හානි සිදුවෙනවා. එවැනි විපත්ති කාලයක් රජගහ නුවරට ඇතිවුණා. අහිවාතක නම් වූ භයානක රෝගයක් පැතිර ගියා. බේරෙන්නට පුළුවන් වුණේ ටික දෙනාටයි. බොහෝ දෙනෙක් ඒ රෝග යෙන් මිය ගියා. එක්තරා සිටු මැදුරකටත් ඒ රෝගය පැතිරුණා. සිටුතුමාත් බිරිඳත් තමන්ගේ පුතා කැඳෙව්වා.

"පුතේ, අපටත් අහිවාතක රෝගය හැදුණා. දැන් ඉතින් අපේ ජීවිතය විශ්වාස නෑ. මේ රෝගය හැදුණු කෙනෙක් බේරුණේ නෑ. මගේ පුතේ, අසවල් අසවල් තැන්වල ධනය සඟවලා තියෙනවා. කෝටි හතළිහක පමණ වස්තුව එහි තියෙනවා. පුතේ, හොඳින් මතක තියා ගන්න. අමතක වෙන්න දෙන්න එපා..... දැන් ඉතින් වහාම මේ පළාතම අත්හැරලා පැනල යන්න. රෝගය බෝවෙන්න කලින් පැනගනින් පුතේ... මේ පව්කාර රෝගය සංසිඳුණු කාලයක ඒ සියලු වස්තුව පුතාට ගන්න පුළුවන්."

මව් පිය බස පිළිගත්තු පුතා රජගහ නුවර අත්හැර පැනගියා. දුක සේ ජීවත් වුණා. නැවත රජගහ නුවරට පැමිණුනේ වසර දොළහකට පස්සෙයි.

එතකොට තමන්ව හඳුනන කවුරුවත් රජගහ නුවර නෑ. අහිවාතක රෝගයෙන් බොහෝ දෙනෙක් මැරිලා තිබුනා. තමන්ගේ සිටු මැදුර තිබුන තැන සොයාගෙන ගියා. හැම දෙයක්ම ගරා වැටිලා තිබුණා. නමුත් මව්පියන් පෙන්නපු ධනය

තියෙන තැන් හොඳින් ආරක්ෂා වෙලා තිබුනා. පුතා කල්පනා කළා.

'මං අඳුරන කවුරුවත් මෙහෙ නෑ. මව්පියන්ගේ ධනය තවම ආරක්ෂා වෙලා තියෙනවා. නමුත් මේක මම ගන්න ගියොත් කවුරුවත් මා ගැන නොදන්නා නිසා මං අමාරුවේ වැටෙනවා.'

පුතා ධන ආසාව අත්හැරියා. කුලී වැඩ කරන්න පටන් ගත්තා. අන්තිමේදී නුවර ප්‍රධාන වීදියේ කම්කරුවන්ව පාන්දරින් අවදි කරවන රස්සාව ලැබුණා. මෙම පුතා මහ හඬින් කතා කරලා කම්කරුවන්ව අවදි කරවනවා. මොහුගේ හඬ ගාම්භීරයි. ගිගුම් දෙනවා. මේ නිසා මොහුට ඝෝෂක කියන නම වැටුණා. දිනක් මොහුගේ දෝංකාර දෙන ගැඹුරු හඬ බිම්බිසාර රජුටත් අසන්නට ලැබුණා. රජු කල්පනා කළා.

'මේ හඬ සාමාන්‍ය හඬක් නොවෙයි. මේ හඬට අනුව නම් මොහු මහා ධනවතෙක් විය යුතුයි.'

බිම්බිසාර රජු ඝෝෂකව කැඳෙව්වා. විස්තර විමසුවා. සිටු පවුලට අයිති කෝටි හතළිහක ධනය ගොඩට ගත්තා. ඝෝෂකට ඒ සියල්ල පැවරුවා. රජගහ නුවර සිටු තනතුර දුන්නා. මෙවැනි මහා ධනයකට හිමිකරුවෙක්ව ඉඳගෙනත්, සාමාන්‍ය කම්කරු රැකියාවක් කරන්නට තරම් මොහුගේ ගුණවත්කමත්, නුවණත්, වීරියත් ගැන කවුරුත් පැහැදුණා. රජතුමා බුදුරජාණන් වහන්සේ ළඟට ඝෝෂක සිටාණන්ව කැඳවාගෙන ගියා.

එවේලෙහි දී භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මෙම ගාථාව වදාළා.

**24.4. උට්ඨානවතෝ සතිමතෝ**
**සුචිකම්මස්ස නිසම්මකාරිනෝ**
**සඤ්ඤතස්ස ච ධම්ම ජීවිනෝ**

**අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති**

නැගී සිටිනා වීරියෙන් යුතු
- ඉතා හොඳ සිහි නුවණකින් යුතු
පිරිසිදුව කරනා දෙයින් යුතු
- සොයා බලනා නුවණකින් යුතු
මනා සංවර සීලයෙන් යුතු
- ධාර්මික ජීවිතයකින් යුතු
පමාවෙන් තොර දිවි ගෙවන්නා
- වේ ය ලොව කිතු ගොස ලබන්නා

පින්වතුනේ, පින්වත් දරුවනේ, දියුණුවේ රහස බලන්න. කෙනෙක් දියුණු වීමට වුවමනා කරන මූලික කරුණු සියල්ලම මෙතන තියෙනවා. පළමුවෙනි කාරණාව උට්ඨාන වීරියයි. එනම් නැගීසිටීමේ වීරියයි. මේ කෙනා හැමතිස්සේම ප්‍රබෝධමත් සිතින් ඉන්නවා. ජීවිතය ගැන නිරවුල්ව සැලසුම් කරනවා. ඒ සැලසුම් ක්‍රියාත්මක කරනවා. නැගීසිටිනා වීරිය එයයි.

ඒ වගේම හොඳ සිහි නුවණක් අවශ්‍යයි. සිහි නුවණක් නැත්නම්, උත්සාහයෙන් නියම ප්‍රයෝජනය ගන්නට බැහැ. ඒ නිසා තමන් කරන සෑම දෙයක් ගැනම හොඳ සිහියක් තියෙන්නට ඕන. 'මා මෙපමණ ගණනක් උපයනවා. මා වියදම් කළ යුත්තේ මෙපමණයි' ආදී වශයෙන් සිහි නුවණින් යුතුව හැම දෙයක්ම කරනවා.

සුචිකම්ම කියන්නේ පිරිසිදු දේවල් කියන එකයි. පිරිසිදු වැඩ කටයුතු යනුවෙන් අදහස් කරන්නේ හොරයක්, බොරුවක්, වංචාවක්, රැවටීමක් නැතිව අවංකව කටයුතු කිරීමයි. අවංකව කටයුතු කරන කෙනා ඒ අවංකකම නිසාම සමාජයේ පිළිගැනීමකට ලක්වෙනවා. එබඳු කෙනෙක් සමඟ ගනුදෙනු කරන්න කවුරුත් කැමතියි.

ඒ වගේම නුවණින් විමසා සොයා බලා කටයුතු කිරීම බුද්ධිමත් කෙනෙකුගේ ලක්ෂණයයි. 'නිසම්මකාරී' කියන්නේ ඒ තැනැත්තාටයි. ඉතින් තමන් කරන කියන කටයුතු නුවණින් විමසා බලා කරනවා නම්, ඔහුට වරදින්න තියෙන අවස්ථා අඩුයි. ඔහුට දියුණු වෙන්න තියෙන අවස්ථා වැඩියි.

පුද්ගලයෙකුගේ ජීවිතයක් සාර්ථක වීමට යම්කිසි සංවරකමක් අවශ්‍යයි. ඒ සංවරකම ලැබෙන්නේ තමන්ගේ ධාර්මික ජීවිතයත් සමඟයි. සංවරකම තුළින් තමන්ගේ චරිතය සංවර්ධනය වෙනවා. ධාර්මික ජීවිතය තුළින් තමන්ට ලොකු සතුටක් ලැබෙනවා. අනුන්ට යහපත සිදුවෙනවා. මේ ලක්ෂණ ඇති ජීවිතය ලෞකික වශයෙන් අප්‍රමාදී ජීවිතයක්. මේ කෙනා තුළ සතුන් මැරීම නෑ. සොරකම් කිරීම නෑ. අනාචාරයේ හැසිරීම නෑ. බොරුව, වංචාව නෑ. මත්පැන්, මත්ද්‍රව්‍ය පාවිච්චිය නෑ. මෙබඳු කෙනෙක් ලෞකික වශයෙන් ප්‍රමාද නෑ. ඒ නිසාම මෙබඳු කෙනෙකුගේ යශෝරාවය හැම තැනම පැතිරෙනවා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, මේ ලක්ෂණ ඔබත් ඇති කරගන්න. ජීවිතයක් ලෞකික වශයෙන් සාර්ථක වීමට මෙම ගාථාවේ සඳහන් උතුම් කරුණ සම්පූර්ණයෙන්ම බලපානවා. පත පත හිටියා කියලා කිසි කෙනෙක් දියුණු වෙන්නෙ නෑ. දියුණු වෙන්නේ එයට වුවමනා කරන හේතු කාරක ධර්ම ඇති කරගත් දවසටයි.



සෙනෙහෙබර

# ආමන්ත්‍රණය

# ආදරණීය අම්මේ... තාත්තේ...

**මේ ඔබෙන් ලද මහඟු දායාදයට කෘතගුණ එක්වූ සෙනෙහෙවන්ත සටහන්...**

**නමෝ බුද්ධාය !!!**
**තෙරුවන් සරණයි !**

**ආදරණීය අම්මෙ තාත්තේ,**

ඔබ දෙදෙනාට ලැබූ අලුත් අවුරුද්ද වාසනාවන්ත නිදුක් නිරෝගී සුවපත් නව වසරක් වේවා. දයාබර අම්මෙ තාත්තේ, ඔයාලා මගේ ඉගෙනීමට එවන මුදල් මට ගොඩක් වටිනවා. 7 වසරට යන මට පොත්පත් ගන්න මට ගොඩක් සල්ලි ඕනි. මට එවන මුදල් වලට ඔයාලට ගොඩක් පින් සිදුවෙනවා. ඒ මුදල් වලින් අම්මා මට පොත් අරන් දුන්නා.

අපි දුරුතු පෝයට සෝමාවතී විහාරස්ථානයේ සිල් සමාදන් වුණා. ඔයාලත් සිල් සමාදන් වෙන්න ඇතැයි කියලා සිතනවා.

ඉතින් මම හවස 3ට අම්මත් එක්ක ආප්ප කඩේට ගිහින් අම්මට උදව් කරනවා. ආපහු ගෙදර එන්නේ රෑ 8 ට තමයි. ඒ නිසා මට ලියුමක් ලියන්න අතපසු වුණාට මට සමාව දෙන්න. කිසිදක නොදැකපු ඔයාලට දීර්ඝායු වේවා. !! සුගති සැප ලැබේවා !! මා හට ඔයාලගේ උපකාර ලැබෙන්නේ පිංවත් ලොකු ස්වාමීන්වහන්සේ නිසානේ. උන්වහන්සේ ඇතුළු සියලු පිංවත් ස්වාමීන්වහන්සේලාට සුවසේම නිවන් අවබෝධ වේවා! ඔයාලගේ දෙපා නමදිමින් මා නවතින්නම්. ඔයාලට තෙරුවන් සරණයි !

**මා කිවිඳු පුතා**

ඉතින් ඔයාලා මට ලබා දුන් ශිෂ්‍යාධාර මුදල් මම මෙලෙස වියදම් කළා. නොවැම්බර් මාසයේ මුදලින් රු. 660 ක් පාසැල් වාර ප්‍රවේශ පත්‍රය ලබා ගැනීම සඳහා වියදම් කළා. ගමේ පන්සලේ කඨින පිංකම සඳහා රු. 50 ක් වියදම් කළා. ඉතිරි මුදල් පාසැල් උපකරණ සඳහා වියදම් කළා. මා කළ පුණ්‍ය කටයුත්ත වූයේ අසපුවේ කඨින පිංකමට සහභාගී වීමයි.

දෙසැම්බර් මාසයේ මුදලින් පාසැල් වාර ප්‍රවේශ පත්‍රයට රු. 660 ක් වියදම් කළා. පාසැල් උපකරණ ගැනීම සඳහා රු. 130 ක් වියදම් කළා. සිල්සමාදන් වීමට යෑම සඳහා ගමන් වියදම් සඳහා රු. 100 ක් ද, ඉතිරි මුදල් නව වසරට පොත් ගැනීම සඳහා ළඟ තබාගෙන ඇත. මා කළ පුණ්‍ය කටයුත්ත වන්නේ 2023 වසර අවසානයේ දෙසැම්බර් 31 දින පිරිත් දේශනයට සම්බන්ධ වීමයි.

මා මෙතෙක් කල් රැස්කළ පිං ඔබ දෙපළටත් ලොකු ස්වාමීන්වහන්සේටත් අනුමෝදන් වෙත්වා.

**තෙරුවන් සරණයි.**

## බුදු සරණයි !

**කැපකරු මාපියන් වෙත,**

පළමුව ඔබට නීරෝගීමත් සුභ දවසක් කියා මා ප්‍රාර්ථනා කරනවා. කැපකරු මෑණියනි, ඔබට කොහොමද? ඔබ සුවෙන් ඇතැයි මම සිතනවා. ඔබ මෙවැනි ශිෂ්‍යාධාරයක් ලබා දීම පිළිබඳව කෘතවේදීතාවය පලකරමි. ඔබ මෙවර ලබා දුන් මුදල මම මෙසේ වියදම් කළෙමි.

පොත් පත් මිලදී ගැනීම - 500
පන්ති යාමට - 1000

මම ඊයෙ පන්ති ගිහිල්ලා ගෙදර එන්න බස් හෝල්ට් එකට ආවම මම දැක්කා වයසක සීයා කෙනෙක් ඉන්නවා. එයා දවස් 3 ක ඉඳන් එතන ඉන්නේ. එයාගෙ ඇස් පේන්නෙත් නැහැ හරියට. එයා තේ එකක් ඉල්ලලා කෑ ගැහුවා. එයාට කවුරුත් මුකුත් ගෙනත් දුන්නෙ නැහැ. මට දුක හිතිලා ඇඬුනා. ඒ වගේ අසරණ තත්ත්වයකට වැටෙන්න තරම් එයා ලොකු පවක් කරන්න ඇති කියාල මට හිතුණා. මම එයාට රු. 350 ක කෑම පාර්සලයක් අරන් දුන්නා මගෙ තාත්තාව මතක් කරලා. අපි හැමදාම කරන පින් පවු විතරයි අපි යනකොට අරං යන්නේ.

මං පන්ති යන්න විදියක් නැතුව වටේ ගෙවල් වලින් ඉල්ලාගෙන පන්ති ගිය වාර අනන්තයි. ඔබ ලබා දෙන මෙම මුදල එබැවින් මට මහමෙරක් වගේ. මෑණියන් ලබාදෙන මෙම මුදලට මම සඳ ණය ගැතියි. ඒවාට මම හොඳින් ඉගෙන ගෙන සාධාරණයක් ඉටුකරනවාමයි. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

**මෙයට,**
**ශිෂ්‍යත්වලාභී දියණිය,**
**තරුෂි විහඟි**

## නමෝ බුද්ධාය !

**පින්වත් කැපකරු අම්මේ/ තාත්තේ,**

මම ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවකි. සරසවි වරම් ලැබුණද ඉදිරියට යන්නට අගහිගකම් බොහොමයක් පැන නැගී ඇති ඉතා දුෂ්කරම මොහොතක මම පසුවෙමි. මම ලැබුණු මේ ඉතා වටිනා අවස්ථාව අත් හැර නොදමා සරසවියට යන්නට තීරණය කළෙමි. ඒ මාගේ කල්‍යාණමිත්‍ර ලොකු ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් පවත්වන ශ්‍රද්ධා ශිෂ්‍යත්ව වැඩසටහන ද, බර්සරි ශිෂ්‍යත්ව වැඩසටහන ද පිළිබඳ විශ්වාසය තබමිනි.

මෙවන් අපහසු තත්ත්වයක සිටින මා හට මාගේ විශ්වාසය සඵල කරමින්, මින් දින කිහිපයකට පෙර මා මෙම ශිෂ්‍යත්ව වැඩසටහනට තෝරාගත් බව දැනගන්නට ලැබුනි. එයින් මා ලද සතුට අපමණකි. මට මාසික ශිෂ්‍යත්ව මුදල ලැබුනි. මෙලෙස මාසිකව මා හට ඔබ විසින් ඉතා අපහසුවෙන් උපයන ධනයෙන් කොටසක් පරිත්‍යාග කිරීම පිළිබඳ මාගේ හදවතින්ම ඔබට මා පින් දෙමි.

මම මේ දින වල සමාසික විභාගය සඳහා මුහුණ දෙමින් සිටින අතර, ඒ සඳහා මා විසින් ඉදිරිපත් කළ යුතු මුද්‍රිත වාර්තා සකස් කිරීමට ඔබ විසින් මා හට ලබා දුන් මුදලින් වැඩි කොටසක් වැය කළෙමි. ඉතිරිය කොටස් කර මාගේ ගමන් වියදම් සඳහා ද යොදා ගත්තෙමි. මෙලෙස මාගේ ඇස් අධ්‍යාපනය නැමැති ආලෝකයෙන් දල්වන්නට ඔබ දරණ උත්සාහය නැවත නැවතත් කෘතවේදීව සිහිපත් කරමි.

මම සම්මා සම්බුදු පියාණන් වහන්සේ පාමුල පොරොන්දු වී පංචශීල ප්‍රතිපදාව සුරකින්නෙමි. එයින් මා ලබන තෘප්තිය

කියා නිමකරන්නට බැරි දෙයකි. ඔබ වැනි කල්‍යාණ මිත්‍රයෙකුට මා හට ලබා දිය හැකි ධනය වන්නේ එයයි. සීලයෙන් ලැබෙන පින් ඔබට අනුමෝදන් කරමි.

ඇස් දෙකෙන් දැක ගන්නට නොමැති, වචනයෙන් උපදෙසක් පතන්නට නොහැකි වුවද, ඔබ වැනි උතුම් කල්‍යාණ මිත්‍රයෙකුගේ ඇසුර මෙලෙසින් ලබන්නට ලැබීම පිළිබඳ මුළු සිතින් ම මා සතුටු වෙමි.

උතුම් දානමය පින් සිදු කරමින් මෙලෙස දැහැමිව දිවි ගෙවන්නා වූ නොදුටු පින්වත් කල්‍යාණ මිත්‍ර කැපකරු අම්මේ තාත්තේ ඔබ එවන මුදල කැපකර මා උගනින අකුරක් අකුරක් ගානේ ඔබට පින් දෙමි.

මගේ මව 2019 වර්ෂයේ සිට සෑම දිනකම නොකඩවා ලක්විරු ගුවන් විදුලිය හරහා විකාශය වන ධර්ම දේශනා සවන් දීමට පුරුදුව සිටියි. මම ද එලෙසම ය. ඒ හරහා මට මෙම වැඩසටහන පිළිබඳව දැනගන්නට ලැබුනි. මා කළ ඉල්ලීම සලකමින් මා ගැන විශ්වාසය තබා මා හට මෙම ශිෂ්‍යත්වය ලබා දීමට කටයුතු කළ මාගේ කල්‍යාණ මිත්‍ර පින්වත් ලොකු ස්වාමීන්වහන්සේ ඇතුළු ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතියේ නියුතු සියලු කාර්යය මණ්ඩලයට ද පින් දෙමි.

හොඳින් ඉගෙන ගෙන, ධාර්මික රැකියාවක් ලබා මා වැනි අපහසුතාවයන්ගෙන් යුතු දරුවන්ට උපකාර කිරීම මගේද සිතුවිල්ලක් වන අතර, එයට උපකාර කරන ඔබට බොහෝ පින් අත්වේවා.

**තෙරුවන් සරණයි.**
**එච් ජී සී එච් ඒකනායක**



# නිග්‍රෝධමිග ජාතකය

නිග්‍රෝධ මුව රජුගේ කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ, මෙයත් හරිම ලස්සන කතාවක්. ඒ කාලේ අපගේ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටියේ සැවැත් නුවර ජේතවනේ. කුමාර කස්සප තෙරුන් වහන්සේ ගේ මෑණියන් නිසයි මේ ජාතක දේශනාව වදාළේ. ඒ මෙහෙමයි.

කුමාර කස්සපයන් වහන්සේගේ මෑණියන් උපන්නේ රජගහ නුවර මහා ධනවත් සිටු පවුලක. ඇත් සංසාරේ ගොඩාක් පින් කළ තැනැත්තියක්.

ඒ ආත්මේ පිරිනිවන් පාන්න තරම් මහා භාග්‍යය ඇතිව සිටි තැනැත්තියක්. සසරේ පුරුදු කළ ඇගේ විදර්ශනා නුවණ ගල් කුලක් ඇතුලේ දැල්වෙමින් තියෙන පහන් එළියක් වගේ තිබුනා. ගිහි ජීවිතේක කම්සැප විඳින්න ඈ පොඩ්ඩක්වත් කැමැති වුනේ නෑ. ඉතින් ඈ දෙමාපියන්ට හඬ හඬා තමන් ගේ අදහස කියා සිටියා.

“අනේ මෑණියනි, පියාණනි... මං කියන දේත් ටිකාක් අහන්න. විවාහ ජීවිතයක් ගෙවන්න මං ආසා නෑ. මට කාමය හරි පිළිකුල්. අනේ... මට... මේ උතුම් බුදු සසුනේ පැවිදි වෙන්න අවසර දෙන්න”

“ළමයෝ... මොනවද මේ දොඩන්නෙ? මේ මහාධනයට එකම හිමිකාරි ඔයා නොවැ. මහණ වෙන්න නම් කවදාකවත් අපෙන් අවසර නෑ. ඒ නිසා ඒ අදහස අත්හැර ගනින්... අපි ඔයාට කටයුත්තක් ලේස්ති කරලා ඉවරයි. ඔහු හොඳ වැදගත් සිටු පුත්‍රයෙක්... ඔහු ගේ ආදර කරුණාව ලැබෙන කොට ඔය මෝඩ අදහස් නැති වෙලා යාවි...” කියලා මේ ගෑණු ළමයාව කසාද බන්දලා දුන්නා.

ඈට සැමියාගෙන් මහත් ආදර ගෞරවයක් ලැබුනා. ඈත් ස්වාමියාට කීකරුව වාසය කළා. ඔය දවස්වල රජගහ නුවර නැකැත් උත්සවයක් තිබුනා. හැමෝම ලස්සනට සැරසුනා. වටිනා ආභරණ පැළඳගත්තා. නමුත් මේ යොවුන් බිරිඳ චාං ඇඳුමෙන් හිටියා. එතකොට සැමියා මෙහෙම ඇහැව්වා.

"සොඳුරී... ඔයා හරී වෙනස්. හැමෝම ලස්සන ඇඳුමින් සැරසෙනවා. ආභරණ පළඳිනවා. ඔයා... ඇයි මේ සාමාන්‍ය ඇඳුමෙන්..."

"අනේ හිමියනි.. මට නම් මේ සරීරේ සරසන්න කියලා විශේෂ වටිනාකොමක් පේන්නෙ නෑ. අනේ... මට හිතෙන්නේ කුණුප කොටස් තිස්දෙකකට අපි රැවටිලා ඉන්නවා කියලා. මේ කය රන්, රිදී, මුතු, මැණික් වලින් කරපු දෙයක් නොවෙයි. සිදුරු නවයකින් අසූචි වෑස්සෙනවා. මහපොළොව නමැති සොහොන පුරෝනවා විතරයි. මේ සරීරය නිසාම නේ හැම කරදරයක් ම. හැම දුකක් ම. හැම වැලපීමක් ම. ආශාව තියෙනකල් ම අපිට තියෙන්නේ විඳව විඳවා ඉන්න එකනෙ.

ඉතින් හිමියනි, මට මේ සරීරයක් නිසා විඳින දුක හොඳට තේරෙනවා. කාමයේ නිස්සාරත්වය හොඳට තේරෙනවා. අසූචි පුරවපු කලයක් පිටතින් සරසනවා වගේ මේක මහා මායාවක්"

"සොඳුරී... හරි පුදුමයි... ඔයා හිතන්නේ භික්ෂුණියක් වගෙයි නොවැ. ඔයාට ඔය තරම් ම ජීවිතේ ගැන වැටහීමක් තිබුනා නම් ඇයි මේ ගිහි ජීවිතේක පැටලුනේ. අපූරුවට මහණ වෙන්න තිබුනා නොවැ"

"ඇත්ත... මං දන්නවා... ඇත්තෙන්ම මගේ එකම පැතුම

වුනෙත් ඒකමයි... නමුත්... මට මගේ දෙමාපියන්ගෙන් අවසර ලැබුනේ නෑ"

"ඒ කියන්නෙ... ඔයාට අවසර ලැබුනොත් අද වුනත් මහණ වෙනවද?"

"අනේ හිමියනි... සත්තමයි... ඔයා මට අවසර දෙනවා නම් අද වුනත් මං හරීම කැමැතියි මේ ගිහි ජීවිතෙන් නිදහස් වෙන්න"

එතකොට සිටුපුත්‍රයාට ඇ ගැන ගොඩාක් අනුකම්පා හිතුනා. කාමයට ආසා නැති, විමුක්තිය පතන අහිංසකාවියක් ගිහි ජීවිතේක සිරකරන එක බරපතල වරදක් කියලා ඔහුට සිතුනා. ඉතින් ඔහු ඇව භාරදෙන්න භික්ෂුණී ආරාමයක් සෙව්වා. ආරාමයක් ගැන තොරතුරු ලැබුනා. හැබැයි ඒක දේවදත්ත යටතේ තියෙන භික්ෂුණී ආරාමයක්. ඔහුට මේ ගැන එතරම් වැටහීමක් තිබුනේ නෑ. ඔහු මහා දානයක් සංවිධානය කළා. මහා පෙරහරින් තම බිරිඳ භික්ෂුණීන්ට භාරදුන්නා. ඇ ඉතා සතුටින් පැවිදි වුනා. ඒ වෙද්දි තම සැමියා නිසා ඇගේ කුසේ දරුගැබක් පිළිසිඳගෙන තිබුනා. නමුත් ඒ බව ඇ දැන සිටියේ නෑ.

ටික කලක් යද්දි ඒ භික්ෂුණියගේ කුස ටික ටික ඉදිරියට නෙරා එන්න පටන්ගත්තා. වැඩිමහල් භික්ෂුණීන් ප්‍රශ්න කළා.

"ආර්යාවෙනි... මොකද ඔය? ගර්භනී තැනැත්තියකගේ වගේ කුස ඉදිරියට නෙරා එනවා නේද?"

"අනේ ආර්යාවෙනි... මං නම් මේ ගැන මොකෝවත්

දන්නෑ. මගේ සීලය නම් ඉතාම පිරිසිදු බව පමණක් මං දන්නවා"

එතකොට අනිත් භික්ෂුණීන් අර භික්ෂුණිය දේවදත්ත ළඟට කැඳවාගෙන ගියා.

"ආර්යයන් වහන්ස, මේ භික්ෂුණිය ගොඩාක් අමාරුවෙන් සැමියාව සතුටු කරවලා අවසරගෙන පැවිදි වුනේ. හැබැයි දැන් දරු ගැබක් තියෙන බව පේනවා. ඇගේ මේ දරුගැබ ගිහි කාලේ වුනාද පැවිදි කාලෙ වුනාද කියලා අපි කියන්ට දන්නෙ නෑ. අපි දැන් මොකක්ද කරන්නේ?"

"හාපෝ... මේක මහා විනාසයක්! මහා නැස්පැත්තියක්... හපොයි.. අහක යන දේකට මටයි ගැරහුම් ලබන්ඩ වෙන්නේ... හා... වහාම මෙයාව ආරාමෙන් අයින් කරවන්න. වහාම සිවුරු හරවන්න"

එතකොට ඒ භික්ෂුණීන් ඇව ආරාමයට රැගෙන ගියා. සිව්රු හරවන්න සූදානම් වුනා. ඈ හඬන්න පටන් ගත්තා. "අනේ ආර්යාවෙනි... මං මහණ වුනේ බුදුරජාණන් වහන්සේ උදෙසා. දේවදත්තයන් උදෙසා නොවෙයි. අනේ මං ඉතාම දුකසේ මේ මහණකම ලබාගත්තේ... අනේ මාව සිව්රු හරවන්න එපා. අනේ මාව භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්න ජේතවනයට එක්කරගෙන යන්න" එතකොට ඒ භික්ෂුණීන් ඇවත් කැටුව යොදුන් හතළිස් පහක දුර ගෙවාගෙන සැවැත් නුවර ජේතවනයට පැමිණියා. භාග්‍යවතුන් වහන්සේ බැහැදැක මේ කාරණය පැමිණිලි කළා.

මහාකාරුණිකයන් වහන්සේ ඒ භික්ෂුණිය සිල්වතියක්

බව හොඳින්ම දන්නවා. ඇගේ ගිහි කාලයේ පිහිටි දරු ගැබක් බවත් දන්නවා. නමුත් සාමාන්‍ය ජනතාවගේ අදහස පරිදි මෙයට විනිශ්චයක් ලබාදිය යුතු බවට තීරණය කළා. ඒ අනුව පසේනදී කොසොල් රජු, අනේපිඬු සිටුතුමා, විශාඛා මහෝපාසිකාව ඇතුළු වැදගත් පිරිස කැඳෙව්වා. සිව්වණක් පිරිස මැද විනයධර භික්ෂූන්ගෙන් අග්‍ර උපාලි තෙරුන්ට විනිශ්චය පැවරුවා. විශාඛා මහෝපාසිකාව අමතා වදාළා. "විශාඛා, මේ නවක භික්ෂුණිය අසවල් මාසයේ පැවිදි වී තියෙන්නේ. ඇගේ දරුගැබ පිහිටියේ පැවිද්දෙන් පසුව ද පැවිද්දෙන් පෙරදැයි දැනගන්න"

"හොඳයි ස්වාමීනී" කියල විශාඛා මහෝපාසිකාව ඈව තිරරෙදි වලින් වටකළ තැනකට ගෙනගොස් කරුණ හොඳින් විමසුවා. ඇයට තියෙන්නේ ගිහිකාලයේ පිහිටි දරුගැබක් බව තහවුරු වුනා. එවිට විශාඛාව උපාලි තෙරුන් වෙත ගොස් එකරුණ සැළකළා. එතකොට තෙරුන් වහන්සේ සිව්වණක් පිරිස මැද ඒ භික්ෂුණිය පිරිසිදු සිල්වත් තැනැත්තියක් බවට විනිශ්චය දුන්නා. ඈ මහත් සතුටට පත්වුනා. අන්ධවනයේ පිහිටි භික්ෂුණී ආරාමයට ඇතුළු වුනා. ඈ ටික කලකින් මහානුභාව සම්පන්න පුත් රුවනක් බිහි කළා.

දවසක් පසේනදී කොසොල් රජු ඒ මෙහෙණ අසපුව ළඟින් යද්දී කිරි දරුවෙකු හඬන ශබ්දයක් ඇහුනා.

"ඇමැතිවරුනි... කිරිදරුවෙකු හඬනවා ඇහෙනවා. මෙහෙණ අසපුවේ කිරිදරුවෙක් හඬන කරුණ මොකක්ද?"

ඇමතිවරුන් මෙහෙණ අසපුවට ගියා. භික්ෂුණීන් ගෙන් එකරුණ දැනගත්තා.

"දේවයන් වහන්ස, ළඟදී සිව්වණක් පිරිස මැද පිරිසිදු බවට විනිශ්චයක් ලැබූ නවක භික්ෂුණිය පුතෙක් බිහිකරලා. ඒ සිඟිත්තා තමයි හඬන්නේ"

"මිත්‍රවරුනි... භික්ෂුණීන්ට දරුපැටියෙක් ඇතිදැඩි කිරීම කරදරයි. අපි ඒ දරු සිඟිත්තා භාරගම්මු"

ඉතින් රාජනියෝගයෙන් ඒ දරු සිඟිත්තා නාටක ස්ත්‍රීන් ගේ භාරයට ගැනුනා. සිඟිත්තාට නම් තබන දවසේ 'කාශ්‍යප' යන නම ලැබුනා.

රජකුමරෙකු ලෙසින් මාළිගයේ ඇතිදැඩි වෙන නිසා 'කුමාර කාශ්‍යප' යන නම ලැබුනා. කුමාර කස්සප සත්හැවිරිදි වියේදී භාග්‍යවතුන් වහන්සේ ළඟ පැවිදි වුනා. විචිත්‍ර ධර්ම කථික භික්ෂූන් අතර අගතනතුරු ලැබුවා. මව් භික්ෂුණියත් රහත් භික්ෂුණියක් බවට පත් වුනා. දම්සභා මණ්ඩපයේ දී භික්ෂූන් මේ ගැන කතා කළා.

"හැබෑට ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ගේ මහාකරුණාව හරි පුදුමයි. අපේ කුමාර කස්සපයන් ගේ මෑණියන් වැරදීමකින් මහණ වුනේ දෙව්දත් පිරිස ළඟ නොවැ. එදා ඇගෙන් කිසිවක් නොවිමසා එළියට බහින්න සිදුවුනා. භාග්‍යවතුන් වහන්සේ කිසිවෙකුට ඇඟිල්ල දික් කරන්න බැරි ලෙස විනයානුකූල විනිශ්චයක් දුන්නා. ඒ නිසා අම්මත් බේරුනා. සිඟිත්තත් බේරුනා"

භාග්‍යවතුන් වහන්සේට මේ කතාව අසන්නට ලැබුනා.

"මහණෙනි, ඔය අම්මව යි පුතාව යි මං බේරගත්තේ මේ

ආත්මේ විතරක් නොවෙයි. පෙර ආත්මෙකත් මං බේරාගත්තා”

එතකොට භික්ෂූන් වහන්සේලා ඒ අතීත සිදුවීම කියාදෙන්නැයි භාග්‍යවතුන් වහන්සේට ආයාචනා කළා. ඒ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ මේ නිග්‍රෝධමිග ජාතකය වදාළා.

“මහණෙනි, ගොඩාක් ඈත කාලෙක බරණැස් පුරේ බ්‍රහ්මදත්ත නමින් රජෙක් වාසය කළා. ඒ කාලේ මහාබෝධිසත්වයෝ මුව යෝනියේ ඉපිද සිටියා. ඒ බෝසත් මුවා මව්කුසින් නික්මෙද්දී ම රන්වන් පාටින් බැබලුනා. නිල් මැණික් වගේ ඇස් දිලිසුනා. අං තට්ටුව රිදී පාටින් දිලිසුනා. සෙමර මුවෙකු ගේ වගේ ලස්සන වලිගයකුත් තිබුනා. ලොකු අශ්ව පැටියෙක් වගේ විශාල සිරුරකුත් තිබුනා. නිග්‍රෝධ මුව රජු යන නමකුත් ලැබුනා. ඉතින් මේ බෝසත් මුවා පන්සියයක මුව පිරිසක් එක්ක මහා වනාන්තරේ වාසය කළා. ඒ මුව රංචුවට අමතරව තවත් පන්සියයක මුව රංචුවක් සිටියා. ඔවුන්ගේ නායක මුවාගේ නම සාඛ. ඒ සාඛ මුවත් රන්වන් පාටයි.

ඒ කාලේ බරණැස් රජ්ජුරුවෝ මුව දඩයමට පුරුදු වෙලා හිටියා. ඔහු මුවමස් නැතුව බත් කන්නේ නෑ. මේ දඩකෙළිය නිසා නියම්ගම් ජනපදවාසීන් ගේ එදිනෙදා වැඩකටයුතුත් කඩාකප්පල් වුනා. දිනපතා මුව දඩයමේ යන්න සිදුවුනා. එතකොට මිනිස්සු මෙහෙම කතා වුනා.

“හපොයි... හරි වැඩක් නොවැ වුනේ. අපේ හැම කටයුත්තක් ම අත්හැරලා දඩයමේ පලයංකො... අපි මෙහෙම කරමු. රාජ උද්‍යානේ ම මුවන් වෙනුවෙන්ම වෙනම කොරටුවක්

හදමු. කැලේ ඉන්න මුවන් ඒකට ගාල් කරමු. වටේට වැට බැඳලා උන්ව කොටු කරලා රජ්ජුරුවන්ට භාර දෙමු”

මේ අදහසට රජතුමාත් කැමැති වුනා. ඉතින් ඒ මිනිස්සු මුවන් කන්න ආසා කරන තණකොළ වර්ග රාජ උද්‍යානේ වගා කළා. දිය කඩිති තැනුවා. වටේට වැට ගැහුවා. ඊට පස්සෙ මිනිස්සු දඬු මුගුරු ආයුධ අරගෙන මුව පිරිස ගාල් කිරීමට යොදුනක් වගේ ප්‍රමාණයකට වනාන්තරේ කොටු කළා. නිග්‍රෝධ මුවරජු ප්‍රධාන මුව රංචුවත්, සාඛ මුවරජු ප්‍රධාන මුව රංචුවත් මෙයට මැදි වුනා. මුවන් කලබල වුනා. නමුත් කරන්ට දෙයක් නෑ. මුවන්ව භය කරමින් කොටු කර කර රාජ උද්‍යානයට ම ගාල් කළා. ගේට්ටුව වැහුවා. රජතුමාට දැනුම් දුන්නා.

“දේවයන් වහන්ස, දැන් ඉතින් මුව දඩයම් වෙනුවෙන් අපට හිංසා නොකළ මැනව. වනාන්තරේ සිටිය මුවන් අපි උද්‍යානයට කොටු කළා. දැන් ඉතින් ඒ මුවන් මරා භෝජන සකස් කළ මැනව”

රජතුමා බොහෝම සතුටු වුනා. මුවන් බලන්න උද්‍යානයට ගියා. රන්වන් පාට විශාල මුවන් දෙන්නාව දැකලා ඒ දෙන්නාට විතරක් අභය දානය දුන්නා. එදා සිට රජතුමා තමන් ම ගිහින් එක මුවෙක් ව විදලා මරණවා. ඇතැම් දවස්වලට අරක්කැමියන් දඩයමට එවනවා. දුනු ඊතල දකිනකොට ම මුවන් කලබල වෙනවා. පැන යන්න දඟලනවා. එතකොට දෙතුන් දෙනාට පහර වදිනවා. තුවාල වෙනවා. ලෙඩ වෙනවා. නිකරුනේ මැරෙනවා.

මුව පිරිස රැස්වෙලා බෝසත් මුවාට මෙය සැළකළා.

එතකොට බෝසත් මුවා සාඛ මුවාව කැඳෙව්වා. "මිත්‍රය... දැන් බොහෝ මුවන් මැරෙනවා. මීට පස්සේ එක එක්කෙනා පිළිවෙළින් දංගෙඩිය ළඟට ගිහින් හිස තබන්න කියමු. එක දවසකට මගේ පිරිසෙන් කෙනෙකුයි ඊළඟ දවසේ ඔබේ පිරිසෙන් කෙනෙකුයි හැටියට මාරුවෙන් මාරුවට යොමු කරමු. එතකොට මුවන් බොහෝ ගණනක් දිනපතා විනාශ වෙන එක වළක්වා ගන්ට පුළුවනි. ඔහුත් එයට කැමති වුනා. එදා සිට මුවන්ට ලොකු හානියක් වුනේ නෑ. දවසකට එකයි මැරුනේ.

ඔය අතරේ සාඛ මුවාගේ පිරිසේ සිටිය එක්තරා ගැබ්බර මුව දෙනකට වාරය පැමිණියා. ඈ ගිහින් සාඛ මුවාට මෙකරුණ සැළකළා.

"හිමියනි, මං ගැබිනියක්. දරුවා බිහිවෙනකම් මට අවස්ථාවක් දෙන්න. ඊට පස්සේ පැටියාට යි මට යි වාර දෙකකට යන්නට පුළුවනි. ඒ නිසා දැනට මගේ වාරය වෙනුවෙන් වෙන මුවෙක් දාන්න"

"තී මේ මොනවා කියනවද? බඩේ පැටියෙක් හිටියට කමක් නෑ. තමන් ගෙ වාරේ ආවා නොවැ. තී ම පල"

එතකොට ඈ හඬ හඬා බෝසත් මුවා ළඟට ගියා. පැමිණිලි කළා. "හොඳයිත්ව. නුඹ දැන් දංගෙඩියට යන්න ඕන නෑ. මං වෙන කෙනෙක්ව යොදවන්නම්" කියලා අර මුව දෙන දංගෙඩියෙන් නිදහස් කළා. බෝසත් මුවා ම දංගෙඩිය ළඟට ගියා. ගිහින් බෙල්ල තියාගෙන හිටියා.

මුවා මරාගෙන යන්න ආපු තැනැත්තා එදා දැක්කේ

රන්වන් පාට මුවරජු දංගෙඩියට බෙල්ල තියාගෙන ඉන්න විදිහයි. ඔහු වහා ගිහින් රජතුමාට මෙය සැළකළා. රජතුමාත් මේ මොකද කියල එතනට ඉක්මණින් ආවා.

"මා මිත්‍ර මුවරජුනි... ඇයි මේ...? මං ඔයාව මරණයෙන් නිදහස් කරලා නොවැ තියෙන්නේ! ඇයි මෙතනට බෙල්ල තියාගෙන ඉන්නේ?"

"දේවයන් වහන්ස... අද වාරය පැමිණිලා තියෙන්නේ ගැබ්බර මුව දෙනකට. පැටියා වදනකල් ඈට ජීවත් වෙන්න ඕනලු. ඈ වෙනුවෙන් වෙන මුවෙක් යවන්නලු. ඉතින් මට ඈ වෙනුවෙන් වෙන කෙනෙකුට මරණ දුක දෙන්න බෑ. ඒ නිසා මං ම ආවා. ඒ ගැන වෙන සැකයක් කරන්න එපා"

"මගේ ආදර මුවරජුනේ... මෙබඳු වූ ඉවසීමක්, මෛත්‍රියක්, දයානුකම්පාවක් මිනිසුන් අතරවත් දැකගන්න අමාරුයි. නමුත් තිරිසන් වූ ඔබ තුළ මහා ගුණයක් තියෙනවා... මගේ රන්වන් මුවරජෝ... නැගිටිනු මැනවි. මං දැන් ඔයාටත්, ඒ බඩදරු මුව අම්මාටත් අභය දානය දෙනවා"

"පින්වත් මහරජුනේ ඔබට දිගාසිරි වේවා!... නමුත් දේවයන් වහන්ස, අනිත් මුව පිරිසටත් මරණභය දැනෙනවා. ඒ මුවනුත් අසරණයි. ඔවුන්ට ජීවත් වෙන්න වාසනාව නැද්ද! ඒ මුවන්ට ඔබවහන්සේගෙන් අභය දානය ලැබේවා!"

"මගේ මුවරජෝ... දුක් වෙන්න එපා. ඔයා ගෙ ඉල්ලීම මට අහක දාන්න බෑ. ඒ සියලුම මුවන්ට මේ මොහොතේ පටන් නිදහසේ ජීවත් වෙන්ට පුළුවනි"

"එතකොට දේවයන් වහන්ස, අනිත් සිව්පාවෝ... ඔවුන්ට සමාවක් නැද්ද... ඔබවහන්සේ ගේ ආදරය අනික් සිව්පාවුන්ටත් ලැබේවා!"

රජතුමා හයියෙන් හිනාවුනා. නිග්‍රෝධ මුවරජාගෙ මුහුණට තමන්ගේ මූණ ළං කළා. ආදරයෙන් වැළඳගත්තා. "හරි හරී... ඔයා වෙනුවෙන් මං ඒ සියලු සිව්පාවුන්ටත් අභය දානය දෙනවා"

"දේවයන් වහන්ස... එහෙනම් මගේ මේ අදහසත් ඉෂ්ට කරලා දෙනවා ද... මං මගේ මුව රංචුවට වගේ ම කුකුළන්, මොනරුන්, තාරාවන් වගේම සියලුම කුරුල්ලන්ටත් ආදරෙයි. මේ ජලාශ වල ඉන්න මාළු, ඉබ්බෝ වගේ සතුන්ටත් මං ආදරෙයි. දේවයන් වහන්ස, ඔබවහන්සේ ගෙන් මට ලැබෙන ආදරය ඒ අසරණ සතුන්ටත් ලැබේවා!"

රජතුමා පුදුමයට පත්වුනා. එතෙක් තිබූ හිනාව වෙනුවට මුවරජු තුළ ඇති අසාමාන්‍ය කරුණාව වෙනුවෙන් දෑසින් කඳුලු කඩා හැලුනා. රජතුමා හඬ හඬා මෙහෙම කිව්වා.

"මගේ රත්තරන් මුව රජෝ... මං ඔයාට වගේම අනිත් හැමෝට ම අද පටන් ආදරය කරනවා. මං ඒ හැමෝට ම අභය දානය දෙනවා. අනේ... මගේ රන්කඳ... මට අනුශාසනා කරන්න. මං ඔයා කියන ඕන දෙයක් කරනවා"

"දේවයන් වහන්ස, එහෙනම්... මව්පියන්ට, අඹුදරුවන්ට, බ්‍රාහ්මණ ගෘහපතියන්ට, නිගමජනපදවාසීන්ට ධර්මය තුළින් ම රැකවරණ සලසන්න. හැමෝට ම යහපත සලසන්න. ඔබට මරණින් මතු දෙව්ලොව යන්න ඒ පිනම ඇති"

ඉතින් රජතුමා ඒ අවවාද හිස් මුදුනින් පිළිගත්තා. රජතුමාට හරි සතුටුයි. මුව රංචුව ටික දවසක් ඒ උයනේ වාසය කළා. රජතුමා මුව කොරටුවේ ගේට්ටු හැරියා. මුව පිරිස නිදහසේ සෙල්ලම් කරමින් මහවනයට ගියා. අර ගැබ්බර මුව දෙන ඉතාම ලස්සන මුව පැටියෙක් වැදුවා. ඒ මුව පැටියා සෙල්ලම් කරද්දි සාඛ මුවා ළඟටත් යනවා. එතකොට ඒ මුව අම්මා පැටියාට කතා කරනවා.

"පුතේ... ඔය සාඛ මුවා ළඟට යන්න එපා. එයා ඔයාට ආදරේ නෑ. ඔයා නිග්‍රෝධ මුවරජු ළඟට යන්න. එයා නිසයි දැන් අපි ජීවත් වෙන්නේ" කියලා මේ ගාථාව කිව්වා.

**"නිග්‍රෝධ මුවරජුව ඇසුරු කළ මැන මයෙ පුතේ**
**සාඛ මුවා වෙත යන්න එපා මයෙ පුතේ**
**නිග්‍රෝධ මුවරජු වෙනුවෙන්**
**මළත් කමක් නෑ පුතේ**
**සාඛ මුවා ළඟ ඔබ**
**ජීවත් වුනත් වැඩක් නෑ පුතේ"**

මහණෙනි, ඊට පස්සේ මුව රංචුව හිතුමනාපේ හැසිරුනා. ගොයම් පැහෙන කාලෙට කුඹුරුවලටත් පනිනවා. මිනිසුන් දැක්කට භය වෙන්නෙත් නෑ. දුවන්නෙත් නෑ. අන්තිමේදී මිනිස්සු ගිහින් රජතුමාට මෙය පැමිණිලි කළා.

"මාගේ ආදර රටවැසියනි... මං නිග්‍රෝධ මුවරජුට පොරොන්දුවක් දුන්නා. මං රාජ්‍යය අත්හැරියත් ඒ පොරොන්දුව කඩන්නෙ නෑ"

නිග්‍රෝධ මුවරජුට මේ කරුණ අසන්න ලැබුනා.

ඔහු මුව පිරිස රැස්කළා. මින් පස්සෙ කුඹුරුවලට ගොයම් කන්නට යෑම තහනම් කළා. මිනිස්සුන්ටත් දැනුම් දුන්නා. මිනිසුන්ට තම තමන්ගේ කුඹුරු වල ආරක්ෂාවට රිටක් සිටුවා කොළඅතුවලින් සංඥාවක් කරන්නට කියල දැනුම් දුන්නා. මිනිස්සුත් ගොයම් පැහීගෙන එද්දි රිටි සිටුවා කොළඅතුවලින් සංඥාවල් දුන්නා. එතැන් පටන් කිසි කුඹුරකට මුවන් ගෙන් පාඩුවක් වුනේ නෑ. හැමෝම සතුටින් කල් ගෙව්වා.

ඉතින් මහණෙනි, අදත් ඒ භික්ෂුණියට ත් කුමාරකස්සපට ත් මමයි පිහිට වුනේ. එදාත් මම යි පිහිට වුනේ. එදා සාඛ මුවා වුනේ දේවදත්ත. ඔහු ගේ පිරිස වුනේ දේවදත්ත ගේ පිරිසමයි. ගැබ්බර මුවදෙන වුනේ අර භික්ෂුණිය. මුව පැටියා කුමාරකස්සප. රජතුමා වුනේ අපේ ආනන්දයන්. නිග්‍රෝධ මුවරජු වුනේ මං නොවැ"

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපේ බුදුරජාණන් වහන්සේ බෝධිසත්ව අවදියේ පවා ජීවිතය ගත කළ ආකාරය හරිම පුදුමයි නේද? එතරම් බුද්ධිමත් කමක්, දයානුකම්පාවක්, ආනුභාවයක් අද මිනිස්සුන්ට නෑ නොවැ.



# රූපයත්, ධනයත්, පිළිගැනීමත්

## ලබන්නට ක්‍රමයක්!

දයාබර දුවේ පුතේ,

මේ ලෝකයේ මිනිසුන් ලබන්නට කැමති දේවල් අතරින් එකක් තමයි 'රූප සම්පත්තිය'... ලස්සනට ඉන්න කවුද අකමැති! හැම කෙනෙක් ම තමන්ගේ රූපය ගැන සැලකිලිමත්. හමේ පාට, උස මහත, කොණ්ඩයේ ස්වභාවය, අඟපසඟ පිහිටා තිබෙන ආකාරය ආදී රූපයට සම්බන්ධ සෑම සියලු දෙයක් කෙරෙහි ම ලොකු අවධානයක් කොයිකවුරු තුළත් දකින්නට පුළුවන්. ඒත්, මනා රූ සපුවක් ලබනවා කියන එක ලෝකයේ දුර්ලභ කාරණයක්.

ඒ වගේ ම තමයි; හැම කෙනෙක්ම වගේ භවභෝග සම්පත්තිය ලබන්නටත් කැමතියි. අතමිට යහමින් මුදල්හදල් ගැවසෙනවාට, හිතේ හැටියට වියපැහැදම් කරන්නට පුළුවන්කමක් තිබෙනවාට, සුවපහසු සැපවත් ජීවිත ගෙවන්නට වුවමනා ධනධාන්‍යයෙන් ආඪ්‍ය වනවාට, ධනවතෙකු විදිහට ජීවත් වෙන්න ලැබෙනවාට කවුද අකමැති...! ඒත්, ධනවත් වනවා කියන එකත් ලෝකයේ ලබන්නට දුර්ලභ කාරණයක්.

වෙන වෙනම සලකා බලද්දි වුණත් රූපවත් භාවයත්, ධනවත් භාවයත් ලබන්න තිබෙන්නේ දුර්ලභ ව නම්... රූපවත් සහ ධනවත් කෙනෙක් විදිහට ලෝකයේ ඉපදෙනවා කියන එක මොනතරම් නම් දුර්ලභ ඇති ද? ඇතැමුන් රූපවත්, හැබැයි ධනය නැහැ. ඇතැමුන් ධනවත්, හැබැයි රූපසම්පන්න නැහැ. බොහෝ පිරිසකට ධනයවත්, රූප සම්පත්තියවත් නැහැ. බොහොම කලාතුරකින් මුණගැසෙන ස්වල්ප පිරිසකට තමයි රූපසම්පන්න බවත්, ධනවත් බවත් කියන ලැබීම් දෙකට ම උරුමය තියෙන්නේ. අපට මුණගැසෙන ලෝකයේ ස්වභාවය එහෙම නේද?

දුවේ පුතේ, අද විතරක් නෙමෙයි; අපගේ ශාස්තෘන් වහන්සේ ජීවමාන ව වැඩ වෙසෙද්දීත් ලෝකයේ මේ වෙනස්කම බොහොම පැහැදිලිව දකින්න ලැබුණා. ඒ වෙනස්කම ගැන එක්තරා අවස්ථාවක දී සම්බුදුරජාණන් වහන්සේගෙන් විමසනු ද ලැබුණා. කෝසල ජනපදයේ කිරුළ හොබවපු පසේනදී කෝසල මහරජුගේ අග්‍ර මෙහේෂිකාව බවට පත් වෙන්න වාසනාව ලැබුණු මල්ලිකා දේවිය තමයි මේ කාරණය සම්බුදුරජාණන් වහන්සේගේ විමසුවේ...

"ස්වාමීනි, මම මේ ආවේ භාග්‍යවතුන් වහන්සේගෙන් කාරණාවක් දැනගන්නයි...

ස්වාමීනි, සමහර ස්ත්‍රීන් ඉන්නවා ලස්සන නෑ. දුර්වර්ණයි. විරූපියි. බලන්න කැතයි. ඒ වගේ ම දුප්පත්. අමාරුවෙන් ජීවත් වෙන්නේ. කිසිම පිළිගැනීමක් නෑ. භාග්‍යවතුන් වහන්ස, මේ වගේ ස්ත්‍රීන් මේ ලෝකයේ ඉන්නවා. එහෙම වෙන්න හේතුව මොකක්ද?"

මෙතැනින් ප්‍රශ්නය ඉවර වුණේ නෑ. මල්ලිකා දේවිය තුන් ආකාර වූ අනිත් ස්ත්‍රීන් ගැනත් සම්බුදුරජාණන් වහන්සේගෙන් විමසුවා.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සමහර ස්ත්‍රීන් ඉන්නවා හරි කැතයි. අර වගේ ම විරූපියි. බලන්න අප්පිරියයි. හැබැයි සල්ලි තියෙනවා. ධනබලය තියෙනවා. පිළිගැනීමත් තියෙනවා. එහෙම වෙන්න හේතුව මොකක්ද?

ස්වාමීනි, සමහර ස්ත්‍රීන් ඉන්නවා හරි ලස්සනයි. දර්ශනීයයි. දකිනකොට සිත පහදිනවා. උතුම් වර්ණයෙන්

යුක්තයි. එබඳු අලංකාර රූ සපුවෙන් හෙබි ස්ත්‍රීන් ඉන්නවා. හැබැයි, හරිම දුප්පත්. එදා වේල කන්න විදිහක් නෑ. කිසිම පිළිගැනීමක් නෑ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එහෙම වෙන්නේ මොකද?

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකයේ තවත් ස්ත්‍රීන් ඉන්නවා, රූපයත් ඉතාමත් ම ලස්සනයි. ඒ වගේ ම ඇයට සල්ලිත් තියෙනවා. ඇය හරී ධනවත්. ඇයට විශාල පිළිගැනීමකුත් තියෙනවා. මෙහෙම වෙන්නේ ඇයි?"

මල්ලිකා දේවියට එදා දකින්න ලැබුණු ඒ වෙනස් වෙනස් ස්වභාවයන් එකිනෙකා තුළ උපදින්නේ මොන වගේ දේවල් නිසා ද කියා අපගේ සම්බුදුරජාණන් වහන්සේ මේ විදිහට පෙන්වා වදාළා.

"මල්ලිකා, ඇතැම් ස්ත්‍රීන් ඉන්නවා, ඒ අය ක්‍රෝධ කරනවා. (ඒ කියන්නේ නිතර ම ගැටෙනවා.) ගැටීම් එක්ක තමයි ඒ ස්ත්‍රිය නිතර ම ඉන්නේ. නිතර ම තරහෙන්, අමනාපයෙන්, ක්‍රෝධයෙන් තමයි මේ ස්ත්‍රිය කල් ගෙවන්නේ. පොඩි වැරැද්දක් වුණොත් බොහෝසෙයින් කිපෙනවා. කිපිලා ගෝරනාඩු කරන්න පටන් ගන්නවා.

ඒ වගේ ම ඇය දන් දෙන්නේ නෑ. මසුරුයි, ලෝභයි. එයා හරිම ඊර්ෂ්‍යාවෙන් ඉන්නේ. අනුන්ට සත්කාර සම්මාන ලැබෙනකොට, ගෞරවය සමාජ පිළිගැනීම ලැබෙනකොට උහුලන්නේ නෑ. ද්වේෂ කරනවා. ඊර්ෂ්‍යාව බැඳගෙන ඉන්නවා.

එබඳු කෙනෙක්ට ආයෙමත් මනුස්ස ලෝකයට එන්න ලැබුණොත් එයාගේ රූපයේ කිසිම ලස්සනක් නෑ. ඒ වගේ ම

ඉතාමත් ම දිළිඳුයි. එයාට ජීවත් වෙන්න වෙන්නේ දුක සේ. එයාව කිසිම පිළිගැනීමකට ලක්වෙන්නේ නෑ..."

ඔය තමයි අපට බහුල කොට දකින්න ලැබෙන උදවිය ව ඒ දුක්ඛිත ඉරණමට පත් කරලපු කරුණු තුන, **ක්‍රෝධ කිරීම, දන් නොදීම හා ඊර්ෂ්‍යා කිරීම...**

අනෙත් උදවිය ගැනත් සම්බුදුරජාණන් වහන්සේ මේ විදිහට පෙන්වා වදාළා.

"මල්ලිකා ඒ වගේ ම තවත් ස්ත්‍රියක් ඉන්නවා, එයත් ක්‍රෝධ කරනවා. ක්‍රෝධයෙන් මැඩුනු සිතින් වාසය කරනවා. හැබැයි එයා දන්පැන් දෙනවා. ඒ වගේ ම එයා අනුන්ට ඊර්ෂ්‍යා කරන්නේ නෑ. ආයෙමත් ජීවිතයක මනුස්ස ලෝකයට එද්දි අර ක්‍රෝධ කිරීමේ හේතුවෙන් ඒ කෙනා ලස්සන නෑ. හැබැයි එයාට හොඳට සල්ලි තියෙනවා. එයාව සමාජයේ හොඳට පිළිගන්නවා.

තව ස්ත්‍රියක් ඉන්නවා, ඒ ස්ත්‍රිය ක්‍රෝධ කරන්නේ නෑ. වෛර කරන්නේ නෑ. අනිත් අය ගොඩාක් බැණ්නත් එයා කේන්ති ගන්නේ නෑ. හැබැයි එයා ඒ විදිහට මෛත්‍රී සිතින් වාසය කළාට, දන් දෙන කෙනෙක් නෙමෙයි. ලෝභයි. ඒ වගේ ම එයා අනුන්ට ඊර්ෂ්‍යා කරනවා. මේ කෙනා ආයෙමත් මනුස්ස ලෝකයේ ඉපදෙද්දී රූපය ගොඩාක් ලස්සනයි. ඒත් එයා හරිම දුප්පත්. එයාට කිසිම පිළිගැනීමක් නෑ.

මල්ලිකා තව කෙනෙක් ඉන්නවා. එයා ක්‍රෝධ කරන්නේ නෑ. වෛර කරන්නේ නෑ. පළිගන්න යන්නේ නෑ. එකටඑක කරන්නේ නෑ. මෛත්‍රියෙන් වාසය කරනවා. ඒ වගේ ම එයා

හොඳට දන් දෙනවා. ඊර්ෂ්‍යා කරන්නේ නෑ. අනුන්ට ලැබෙන ලාභසත්කාර, කීර්ති ප්‍රශංසා ගෞරව, වන්දනමාන, පුදපූජා ආදිය ගැන මෙයා සතුටු වෙනවා. එබඳු කෙනෙක් මරණයට පත් වෙලා ආයෙමත් මනුස්ස ලෝකයට එද්දි ඇය බොහොම රූපසම්පන්නයි. දුටුවන් ඇයට පහදිනවා. ඇය ලෝකයේ ගෞරව ලබනවා. ඒ වගේ ම එයා බොහොම ධනවත්. වැදගත්. ඇයට විශාල පිළිගැනීමක් තියෙනවා."

දුවේ පුතේ, මේ හැම වෙනස්කමක් පිටිපස්සෙම තියෙන්නේ මෙත් සිත, දන් දීම, ඊර්ෂ්‍යා නොකිරීම කියන ගුණධර්මයන්ගේ ඇතිනැති බව පිළිබඳ කථාවක්. මේ උතුම් ධර්ම කාරණාව සම්බුදුරජාණන් වහන්සේ ඉදිරියේ අහපු මල්ලිකා දේවිය ඒ දහම් කැඩපතින් තමන් ව ම දැකගත්තා. ඇය මේ විදිහට කිව්වා.

"අනේ ස්වාමීනි, මම එහෙනම් පෙර ජාතියක ක්‍රෝධ කරපු කෙනෙක්. පොඩ්ඩක් කිව්වම ගොඩක් බැණපු කෙනෙක්. ඒ නිසා වෙන්න ඕන ස්වාමීනි, මම මේ ජීවිතයේ මෙච්චර කැත.

හැබැයි ස්වාමීනි, මම හොඳට දන් දීපු කෙනෙක්. ඒ නිසා ස්වාමීනි, මට දන් හරියට ධනය තියෙනවා.

ස්වාමීනි මම කලින් ජීවිතවල අනුන්ගේ ලාභසත්කාරවලට, ගෞරව අභිවාදන වන්දනමානවලට ඊර්ෂ්‍යා කරපු කෙනෙක් නෙමෙයි. ඒ නිසා ස්වාමීනි මේ රාජ කුලයේ ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති සියලු කන්‍යාවියන් අතරේ මම අග්‍ර වෙලා, අධිපති වෙලා, ඉසුරුමත් භාවයෙන් යුතුව වාසය කරනවා."

දහම් කැඩපතින් තමාව දැකපු මල්ලිකා දේවිය එතැනින් නැවතුණේ නෑ, ඒ තුළින් දැකපු අඩුපාඩු හදාගන්නත් උත්සාහවත් වුණා.

"ස්වාමීනි, මම දන්ම ම මේ දේවල් පුරුදු කරන්න ගන්නවා. මම අද ඉඳලා කේන්ති ගන්නේ නෑ. අනෙක් අය මට ගොඩක් බැණ්නත් නිශ්ශබ්ද ව ඉන්නවා, කිපෙන්නේ නෑ.

ඒ වගේ ම ස්වාමීනි, මම තවදුරටත් දන් දෙනවා. මම අනුන්ගේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවලට ඊර්ෂ්‍යා කරන්නේ නම් නෑ.

ස්වාමීනි, මම අද ඉඳලා භාග්‍යවතුන් වහන්සේ ව සරණ යනවා. ධර්මය සරණ යනවා. සංඝයා සරණ යනවා."

දුවේ පුතේ, ස්ත්‍රියකට වුණත් - පුරුෂයෙකුට වුණත් රූප සම්පන්න වෙන්නත්, ධනවත් වෙන්නත්, පිළිගැනීමක් ඇති කෙනෙක් වෙන්නත් උපකාරක වන ගුණධර්ම තුන තමයි මෙත් සිතින් යුතු වීම, දන් දීම සහ ඊර්ෂ්‍යා නොකිරීම... ඉතින් ඔන්න අපි ඔබ දෙසටත් ඒ දහම් කැඩපත හැරෙව්වා. දැන් ඔබට ම පුළුවනි ඔබ ව විමසා බලන්න.

නුවණ ඇති මල්ලිකා දේවිය කළා වගේ ම, ඒ දහම් කැඩපතින් විමසමින් තමාව දැකලා, තමාගේ අඩුපාඩු හදාගෙන ඔබත් ගුණධර්මයන්ගෙන් වැඩෙන්න.

ලෝකයේ බොහෝ දෙනා ලබන්න කැමති නමුත් ලබන්නට අතිශයින් දුෂ්කර රූපයෙන් ද ධනයෙන්ද පිළිගැනීමෙන් ද යුතු වූ අයෙකු ලෙස සාංසාරික ජීවිතය හැඩගස්වා ගන්නත්, උතුම්

තිසරණයේ පිහිටමින් සසර දුක් නිවා සැනසෙන්නත් ඔබට මේ ගුණධර්මයන් නිසැක උපකාරයක් ම යි!

උතුම් තෙරුවන් සරණින් ඔබ ද ගුණධර්මයන් සුවසේ වඩමින් දියුණුව ම ලබත්වා!

**තෙරුවන් සරණයි!**

(ඇසුර - මල්ලිකා සූත්‍රය, අංගුත්තර නිකාය 02)

# නිර්මාණ ඉසව්ව

පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව




වයි.ඒ. වගීෂා සකුණි අස්මිතා
දියණිය විසින් එවූ නිර්මාණයක්...




එච්.එම්. කවීෂා සඳමිණී
දියණිය විසින් එවූ නිර්මාණයක්...




ඩබ්.එම්. චතුත්තරා කාවින්දයා දුලක්ෂි
දියණිය විසින් එවූ නිර්මාණයක්...



ඩී.ජී. කවීෂා ගුවනි දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
ආර්.එම්. සඳුනිකා ශෂිනි කුමාරි දියණිය විසින් එවූ නිර්මාණයක්...




ආර්.එම්. රසිඳු ජනිත් රත්නායක
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
එන්. පී. ගඟුලි නයනතාරා
දියණිය විසින් එවූ නිර්මාණයක්...



බී. සහනි වර්ෂා දියණිය විසින් එවූ නිර්මාණයක්...




07 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
එන්.ජී. අමානි චේතනා ජයතිස්ස
දියණිය විසින් එවූ නිර්මාණයක්...




එන්.ජී. ධනංජ ඉසුරු උදාර
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



කේ.ජී. ගෞරවී ප්‍රසාදි
දියණිය විසින් එවූ නිර්මාණයක්...



ආර්.එම්. ප්‍රගීත් උදාර රාජපක්ෂ
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...




11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.එම්. කාවින්ද්‍යා සෙව්වන්දි
දියණිය විසින් එවූ නිර්මාණයක්...



13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
එන්.ජී. කාවින්ද්‍යා චමෝදි ජයතිස්ස
දියණිය විසින් එවූ නිර්මාණයක්...




උදාරි වත්සලා
දියණිය විසින් එවූ නිර්මාණයක්...



එම්.එන්. මදූෂි නිසුනා ජයරත්න
දියණිය විසින් එවූ නිර්මාණයක්...



13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
එන්.ජී. කාවින්දයා චමෝදි ජයතිස්ස
දියණිය විසින් එවූ නිර්මාණයක්...



කතඤ්ඤූ කතවේදී පුග්ගලෝ

**දුල්ලභෝ ලෝකස්මිං**

---

**කෙළෙහිගුණ දන්නා**

**සිහිකරනා පුද්ගලයා**

**ලෝකයේ දුර්ලභය...**

**නමෝ බුද්ධාය..!!!**

තෙරුවන් සරණයි... පින්වත් ස්වාමීන් වහන්ස,

මගේ නම අනිල් කුමාර... මීට අවුරුදු 4,5 පමණ පෙර මා විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය අරඹා මා හට මතක විදියට මුල් වසරේ මැද භාගයේ පමණ සිට විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය අවසන් වන තෙක්, ඔබ වහන්සේගේ ගෞරවණීය අනුග්‍රහයෙන් මා හට ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වයක් හිමි වුණා... එම මුදල් මාගේ අධ්‍යාපන කටයුතු වලට වාගෙම, යම් යම් පින්කම් සිදු කර ගැනීමටත් මා හට උපකාරී වුණා... ඒම උපකාරය නිසාවෙන් මාගේ දෙමාපියන්හට ද මාගේ අධ්‍යාපන වියදම් සදහා සහනයක් වුවා ස්වාමීන් වහන්ස. මා හට කල එම උපකාරයට මාත් මාගේ දෙමාපියන් දෙපලත් පින්වත් ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේටත්,පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටත් ඒ සදහා උදව් උපකාර කල ගෞරවණීය මහා සංඝ රත්නයටත්, මා වෙනුවෙන් මා කිසි දිනක ඇසින්වත් නොදැක ඉමහත් ශ්‍රද්ධාවෙන් උපකාර කල ආදරණීය කැපකරු සියලු දෙමාපියන්ටත්,ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව කාර්යමණ්ඩලයේ සියලු දෙනාටත් මෙත් සිතින් අනේක වාරයක් පින් දෙමී.... අනේක වාරයක් පුණ්‍යානුමෝදනා කරමී... සංසාර දුකින් නිදහස් වීමට අමා මහා නිවන පිණිස මේ පින් සියලු දෙනාට උපකාර වේවා... ඒ අමා මහා නිවන බොහෝ දුර නොවේවා... සියලු දෙනාට නිදුක් නීරෝගි දීර්ඝායුෂ ලැබේවා...

පින්වත් ස්වාමීන් වහන්ස...

මා දැනට කුවේට් රටේ සේවය කරමින් ඉන්නේ...මා හට කල උපකාරයට කලගුණ සැලකීමක් ලෙස මමත් එලෙස කැපකරු දෙමාව්පියෙක් වී අධ්‍යාපනය හදාරන දරුවෙක් වෙනුවෙන් දායකත්වය දරමින් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන හා සම්බන්ධ වීමට ලැබීම ගැන මා හට ඇත්තේ ඉමහත් සතුටකි.. තවද මාගේ පුංචි කෙනෙකුත් කුවේට් රටේ සේවය කරමින් ඉන්නවා. අප දෙදෙනාම වැඩසටහන හා සම්බන්ධ වීමට ලැබීම ගැන ගොඩක් සතුටු වෙනවා ස්වාමීන්වහන්ස... ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභි දරුවෙකු ලෙස මා මෙම වැඩසටහනේ ගුණාත්මකබව බෙහෙවින් අගය කිරීමට කැමත්තෙමි... මෙවැනි පුණ්‍ය කටයුතු තව තවත් හොදින් සිදු කිරීමට ගෞරවණීය පින්වත් ස්වාමීන් වහන්සේලාටත්, අධ්‍යාපන ශිෂ්‍යත්ව කාර්යමණ්ඩලයේ සියලු දෙනාටත් තුණුරුවනේ අනන්ත වූ අශිර්වාදය ලැබේවා...

**තෙරුවන් සරණයි...**
**නමෝ බුද්ධාය!**

**දුන්නිග්ගහස්ස ලහුනෝ - යත්ථකාමනිපාතිනෝ**
**චිත්තස්ස දමථෝ සාධු - චිත්තං දන්තං සුඛාවහං**

මේ 'සිත' කියන්නේ නිග්‍රහ කරලා
දමනය කරන්නට අමාරු දෙයක්.
එක මොහොතින් වෙනස් වෙනවා.
ආස කරන දේටමයි ඇදිලා යන්නේ.
එබඳු සිතක් දමනය කරගැනීම කොයිතරම් හොඳ දෙයක්ද.
දමනය කළ සිතින් මහා සැපයක් ලබන්නට පුළුවනි.

(සැවැත් නුවරදී එක්තරා භික්ෂුවක් අරභයා වදාළ ගාථාවකි)
ධම්ම පදය - චිත්ත වර්ගය

**යථාපි පුප්ඵරාසිම්හා - කයිරා මාලාගුණේ බහූ**
**ඒවං ජාතේන මච්චේන - කත්තබ්බං කුසලං බහුං**

දක්ෂ මල්කාරයෙක් ලස්සන මල් ගොඩක්
එකතු කරලා මල් මාලා ගොඩක් ගොතනවා වගේ,
මිනිස් ලෝකෙ ඉපදිච්ච කෙනා ඒ විදිහටම
පුළුවන් තරම් **කුසල්මයි** කරගන්න ඕනෙ.

(සැවැත් නුවරදී විශාඛා උපාසිකාව අරභයා වදාළ ගාථාවකි)
ධම්ම පදය - පුප්ඵ වර්ගය

©2023 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P. 0112 571 471 | Fax : 0112 548 400 | Web : www.shraddha.lk | Email : edu@shraddha.lk

ShraddhaTV ShraddhaTV ShraddhaTV ShraddhaTV